## ගරු නගරාධිපති තුමන්ගේ පණිවුඩය



2008 වර්ෂයේ ලෝක ජනාවාස දින සැමරුම සඳහා මොරටුව නගරය තෝරාගැනීම පිළිබඳව අතිශයින් සතුටට පත්වන අතර ඒ සම්බන්ධව නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය වෙත මොරටුව ජනතාව වෙනුවෙන් මාගේ හෘදයංගම ස්තූතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි .

ඉතා වේගයෙන් සංවර්ධනය කරා පියනගන කාර්මික නගරයක් වශයෙන් මොරටුවට හිමීවී ඇත්තේ වැදගත් ස්ථානයකි . දැව කර්මාන්තය හේතුවෙන් මෙරට පමණක් නොව ජාත්‍යන්තර පවා සිය නාමය සනිටුහන් කර ඇති මොරටු පුරවරය අප දන්නා අනාගත ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය නගරයක් බවට පත්කිරීම අපගේ අරමුණයි .

එම අරමුණ ශාක්ෂාත් කරගැනීම සඳහා අප සයලු දෙනා සාමුහිකව යන ගමනේදී අප ඉදිරියේ ඇති අභියෝග ජයගැනීම සඳහා 2008 ලෝක ජනාවාස දින සැමරුම විශාල ශක්තියක් අප වෙත ලබාදුන් බව සතුටින් සඳහන් කරමි .

**ඩබ්ලිව් සමන්ලාල් ප්‍රනාන්දු**
**නගරාධිපති**
**මොරටුව මහනගර සභාව**